**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2015**

---------------------------------------------

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන විට ප්‍රත්‍යාගණනයක් සිදුකර ප්‍රත්‍යාගණිත අගයන් ගිණුම්වල ගැලපිය යුතු වුවත් පිරිවැය රු.3,638,765 ක්වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් නමුත් සභාව විසින් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.585,730 ක්වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය විසින් සභාව වෙත අයිතිය පවරන ලද දැනට සභාව විසින් භාවිතා කරනු ලබන වාහන ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද පරිත්‍යාග වශයෙන් ලැබූ කාර්යාල උපකරණ අයිතම් 22 ක්ද අගය කොට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් දෙදෙනෙකු වෙත ලබාදුන් එකතුව රු. 106,344 ක් වූ ආපදා ණය වියදමක් ලෙස ගිණුම් ගත කර තිබූ අතර ණය වාරික හා පොළී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.820,359 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,985,071 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,805,430 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී මුළු වියදම රු. 2,464,134 කින් වැඩි වුවද, මුළු ආදායම රු. 6,269,564 කින් වැඩිවීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේදී අතිරික්තයක් පැවතියද 2012 වර්ෂයේදී විශාල ඌනතාවයක් ඇති වී තිබුණි. එම ඌනතාවය 2013 වර්ෂයේ සිට ක්‍රමිකව අඩු වී 2015 දී අතිරික්තයක් බවට පත්වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී සභාවේ දායකත්වය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී තිබූ අතර එය 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 104 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ප්‍රදාන රු.7,468,000 කින් වැඩිවීම හා සමස්ත වියදම ඉක්මවා රාජ්‍ය ප්‍රදාන රු.576,000 ක් ලබාදීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 6 වන වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ අරමුණු පහත දැක්වේ.

- රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ අධීක්ෂණය කිරීම.
- භාෂා භාවිතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV ඡේදයට අනුකූලව සිදුවන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රාජ්‍ය භාෂා ඇගයීම දිරිගැන්වීම.
- භාෂා භාවිතය සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සඳහා විමර්ශන පැවැත්වීම සහ ප්‍රතිකර්ම යෙදීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්ය සාධන වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නිරීක්ෂණ අනාවරණය විය.

(අ) විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන 38 ක් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබුණද විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන 26 ක් වෙනුවෙන් වැඩසටහන් පවත්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම පිළිබඳව ලැබුණු පැමිණිලි 91 න් පැමිණිලි 45 ක් වර්ෂය අවසාන වනවිට විසඳීමට නොහැකි වී තිබුණි.

(ඇ) ද්විභාෂා පරිපාලන කොට්ඨාශ තුළ විගණනයට ලක් නොකරන ලද රාජ්‍ය ආයතන 50ක් විගණනයට ලක් කිරීමට සැළසුම් කර තිබුණද, ආයතන 22 ක භාෂා විගණනය කිරීමට සමාලෝචිත වර්ෂය තුලදී අපොහොසත් වී තිබුණි.

(ඈ) සමාජ ඒකාබද්ධතා සතිය තුළ පාසල් ළමුන් සඳහා ‟රාජ්‍ය භාෂා / ජාතික භාෂා සම්බන්ධයෙන් යහපත් ආකල්ප ඇති කිරීම'' පිළිබඳ වැඩසටහනක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී එම වැඩසටහන පවත්වා නොතිබුණි.

**4.2 හදුනාගත් පාඩු**

සේවක අර්ථසාධක අරමුදල් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 77,213 ක අධිභාර ගෙවා තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී රු. 43,024 ක් වැය කර ගිණුම් කටයුතු සඳහා මෘදුකාංගයක් මිල දී ගෙන තිබුණද, එය 2016 මාර්තු 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විධායක නොවන තනතුරු 6 ක් පුරප්පාඩු වී තිබීම හේතුවෙන් ආයතනයේ අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

**5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133(1) පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් හෝ විගණනයක් සිදු කර නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

අවශ්‍යතාව ඉක්මවා නිලධාරින් 30 දෙනෙකු පමණ සේවය කරන කොමිෂන් සභාව සඳහා වර්ග අඩි 6000 කින් යුත් තෙමහල් ගොඩනැගිල්ලක් 2014 වර්ෂයේදී රු. 450,000 ක මාසික කුලියකට ලබාගෙන තිබුණි. එම ගොඩනැගිල්ලේ බිම් මහල 2016 මැයි දක්වාම නිෂ්ක්‍රීයව පැවති අතර තෙවන මහලේ ශ්‍රවණාගාරයක් ස්ථාපිත කර ඇතත් විගණිත දිනය දක්වාම කිසිදු වැඩසටහනක් පවත්වා නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ කෙටියෙන්** |
|---|---|
| (අ) වත්කම් පාලනය | වර්ෂ 3 කට හෝ 5 කට වරක් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු නොකිරීම, අමාත්‍යාංශයෙන් පවරන ලද වාහන ගිණුම් ගත නොකිරීම. |
| (ආ) කාර්ය මණ්ඩල පාලනය | සමහර තනතුරු වර්ෂ 5 කට අධික කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතීම. |